මීනුවන්ගොඩ නගර සභාව

----------------------------

ගම්පහ දිස්ත්‍රික්කය

--------------------

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 06 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 18 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මීනුවන්ගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) ලංකා බැංකු ස්ථාවර තැන්පතුවක 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.1,937,408 ක් ලෙස බැංකුව විසින් සනාථ කර තිබුණද,ගිණුම්වල රු.1,895,042 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි ශේෂය ගිණුම්ගත කළ යුතුවේ. | ජර්නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව දන්වමි. |
| (ආ) පරිත්‍යාග ලෙස ලැබූ රු.1,056,436 ක් වටිනා ළමා පොත් රාක්ක 10 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ගබඩාවට ලැබීම් නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ජර්නල් සටහන් මඟින් නිවැරදි කර ඇති බව දන්වමි. |
| (ඇ) ඉකුත් වර්ෂයේ තොග ගිණුමට හා ගබඩා ණයහිමි ලෙස ගිණුම් ගත කර තිබූ රු.49,675 ක් වූ තොග අයිතම 06 ක් සමාලෝචිත වර්ෂයේදී ද තොග ලැබීම් හා ණය හිමි ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබිය යුතුවේ. | ජර්නල් සටහන් මගින් නිවැරදි කර ඇති බව දන්වමි. |

1.3.2 **නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් විෂයයන් 06 ක ශේෂයන් හා උපයෝගි ලේඛන අනුව ශේසයන් අතර රු. 531,714 ක ශේෂයක් පැවතුණි. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම ශේෂයන් නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. |

1.3.3 ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 අප්‍රේල් සිට 2019 දෙසැම්බර් දක්වා එකතු කර තිබූ මුද්දර බදු රු.28,245 ක් දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | 2019 දෙසැම්බර් මස දක්වා ගෙවීම් මේ වන විට පිළියෙල කර ඇති බව දන්වමි. |

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වටිනාකම රු.590,092 ක්වූ තොග ගිණුමේ ශේෂයට අදාල නිකුත් කිරීමේ නියෝග 06 ක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම් ශේෂ තහවුරු කරන තොරතුරු ඉදිරිපත් කළ යුතුවේ. | නිකුත් කිරීමේ නියෝග ඉදිරිපත් කර ඇති බව දන්වමි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.30,511,099 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 18,370,593 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. |
| (i) | වරිපනම් හා බදු | 11,279 | 11,704 | 8,380 | 5,895 | 10,287 | 11,659 | 10,550 | 7,058 |
| (ii) | කුලී | 21,993 | 22,366 | 22,061 | 930 | 20,398 | 21.356 | 21,006 | 1,297 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 800 | 526 | 526 | . | 620 | 491 | 491 | |
| (iv) | වෙනත් ආදායම් | 119,025 | 84,058 | 119,277 | - | 29,281 | 16,101 | 16,101 | - |
| | | 153,097 | 118,654 | 150,244 | 6,825 | 60,586 | 499,607 | 48,148 | 8,355 |

2.2.2 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නව සතිපොළ රථගාල 2019 වර්ෂයට බදුදීමේදී අදාල ගිවිසුමේ කොන්දේසි අංක 03 අනුව තුන්මස ගිවිසුම් ඇප සහ රජයේ අනුමත බදු මුදල සමඟ රු.126,243 ක මුදලක් සභාවට ගෙවා ගිවිසුමට එළඹිය හැකි වුවද රු.54,310 ක් අඩුවෙන් ලබාගෙන ගිවිසුමට එළඹ තිබුණි. තවද ටෙන්ඩරයේ ඉතිරි මාස 09 ක මුදලට සමාන රක්ෂණ ආවරණයක් හෝ දේපල ඇපකරයක් ලබා ගෙන නොතිබුණි. | කොන්දේසි ප්‍රකාරව ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී මෙවන් දෑ සිදු නොවීමට වග බලා ගන්නා බව දන්වමි. |
| (ආ) | නිච්හැම් පාර ආරම්භක ස්ථානයේ ඇති භූමිය තක්සේරු කිරීමකින් හා අවම ලංසු මුදල තීරණය කිරීමකින් තොරව මසකට රු.15,000 කට 2019 මැයි සිට දෙසැම්බර් දක්වා කාලයට බදුදී තිබූ අතර බදුකරු විසින් කඩ කාමර 10 ක් ඉදිකර තිබුණි. එම කඩ කාමරවලින් කිහිපයක් බදුගත් පුද්ගලයන් විසින් අතුරු බදුදී තිබුණි. | සභාව සතු දේපල මගින් බාහිර පුද්ගලයන්ට අනිසි ආකාරයට මුදල් උපයාගැනීමට ඉඩ නොසැලසිය යුතුවේ. | ආදායම් පරීක්ෂක විසින් තීරණය කර තිබූ අවම ලංසු මුදල වන දිනකට රු.400.00 ක මුදල පාදක කර ගනිමින් වැඩිම ලංසුව වන රු.15000.00(දිනකට රු.500) ජයග්‍රාහී ලංසු මුදල ලෙස තීරණය කර ඇති බව දන්වමි. |

2.2.3 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නගර සභාව විසින් නිකුත් කල වෙළඳ බලපත්‍රයක් රහිතව මිනුවන්ගොඩ ප්‍රදේශයේ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යනු ලබන මහා පරිමාණ පානීය ජලය විකිණීමේ ව්‍යාපාරයකට ජලය ලබා ගැනීම සඳහා ජල නලය ගැඹුරට විදීම හේතුවෙන් ප්‍රදේශයේ පානීය ජල හිඟතාවයකට මුහුණපෑමට සිදුවන බව ප්‍රදේශවාසීන්ගෙන් නගර සභාවට පැමිණිලි යොමුවී තිබූ අතර ඒ සම්බන්ධයෙන් කිසිඳු විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පරිසරයට හානිදායක කර්මාන්ත සම්බන්ධයෙන් පියවර ගැනීමට කටයුතු කළ යුතුවේ. | වෙළඳ බලපත්‍රයක් නිකුත් කර නොමැති අතර මේ සම්බන්ධව දැනුවත් කිරීමට සභාවට කැඳවීම් කර ඇති බව දන්වමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) වාර්ෂික කාර්ය සාධන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ((අ) වාර්ෂික කාර්ය සාධන සැලැස්මේ සඳහන් කර තිබූ බලපත්‍ර ගාස්තු නොගෙවූ ව්‍යාපාර සම්බන්ධයෙන් නඩු පැවරීම ,2018 වසර දක්වා හිඟ ශේෂ සහිත වරිපනම් හිමියන්ගේ දේපල තහනමට ලක් කිරීම.ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කසළ විකුණුම් පොළ සෑම මාස 04 කට වරක් පැවැත්වීම, ළමා අපයෝජන වලක්වාලීම සඳහා වන දැනුවත් කිරීමේ වැඩ සටහනක් පැවැත්වීම හා මිනුවන්ගොඩ පොලිසිය හා එක්ව කාන්තාවන්ට ඇති නීතිමය ආරක්ෂාව පිළිබඳව දැනුවත් කිරීමේ කාර්යයන් සිදු කර නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් ඉටු කළ යුතුවේ. | බලපත්‍ර ලේඛනයට අනුව මුළු මුදල් අය කර ඇති අතර ජංගම සේවා මඟින් හිඟ අය කිරීමට කටයුතු කර ඇති අතර සැලැස්මෙහි සඳහන් සියළු වැඩසටහන් කිරීම අනිවාර්ය නොවන බැවින් ඒ වෙනුවෙන් වෙනත් වැඩසටහනක් පවත්වා ඇති බවත් දන්වමි. |

(ආ )කසල කලමනාකරණය

----------------------------

| | | |
|---|---|---|
| කසළ කළමනාකරණය විධිමත්ව සැලසුම් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | කසළ කළමනාකරණ ප්‍රතිපත්ති සැලසුම් කිරීමට හා ක්‍රියාත්මක කිරීම කෙරෙහි සභාවේ අවධානය යොමු කළ යුතුවේ | 2020 මැයි සිට නොදිරන කසළ දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ නාවාන කොම්පෝස්ට් අංගනයට යැවීමට කටයුතු යොදා ඇති බැවින් මෙම ගැටළුකාරී තත්ත්වය අවම වනු ඇත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සභාවට අයත් රූඩ් 01 පර්චස් 6.25 ක පැරණි සෝගාතක ස්ථානයේ ඉඩම එක් කාන්තාවක් විසින් භුක්ති විදින අතර 2011 වර්ෂයේදී ඒ සඳහා ප්‍රකාශන ඔප්පුවක් සභාව විසින් පිළියෙල කරගෙන තිබුණි. එම ඔප්පුවේ සඳහන් ඉඩම් ප්‍රමාණය පර්චස් 24.59 ක් වූ අතර ඉතිරි පර්චස් 21.66 ක් භෞතිකව සභාවට අයත් වන බවක් තහවුරු නොවීය. | සභාව සතු දේපලවල අයිතිය හා පැවැත්ම තහවුරු කර ගත යුතුවේ. | වර්තමාන සභාව විසින් අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට සභා සම්මුතියක් ගෙන පළාත් පාලන දෙපාර්තමේන්තුව, පළාත පාලන අමාත්‍යාංශය හා ආණ්ඩුකාරවරයාගේ කාර්යාලය වෙත යොමු කර ඇති බව දන්වමි. |
| (ආ) සභාව සතුව තිබී ලංකා විදුලි බල මණ්ඩලයට පවරාදී තිබූ පරාක්‍රම ක්‍රීඩා පිටියට යාබද ඉඩම් කොටස නැවත සභාවට පවරා ගැනීමේදී රූඩ් 01 පර්චස් 8.15 ක බුළුගහයායවත්ත ඉඩමෙන් ප්‍රජාශාලාව සහිත පර්චස් 11.45 ඉවත් කර පර්චස් 36.7 ක ප්‍රමාණයක් විදුලි බල මණ්ඩලයට ලබා දීමට කැමති බව දන්වා තිබූ අතර ඒ අනුව අත්හැරීමේ ඔප්පුවක් මගින් පරාක්‍රම ක්‍රීඩා පිටියේ ඉඩම විදුලි බල මණ්ඩලය විසින් අත්හැර තිබුණි.ඒ අනුව නගර සභාව විසින්ද අත්හැරීමේ ඔප්පුවක් මගින් රූඩ් 01 පර්චස් 8.15 ක බුළුගහයාය ඉඩමේ මුලු ප්‍රමාණයම අත්හැරීමට කටයුතු කර තිබූ අතර පර්චස් 36.7 ක් පැවරීම වෙනුවට ප්‍රජාශාලාවක් සහිත ඉතිරි පර්චස් 11.45 ක කොටසද විදුලි බලමණ්ඩලයට පැවරීම කර තිබුණි. | සභාව සතු දේපලවල අයිතිය හා පැවැත්ම තහවුරු කර ගැනිම. | ඊට අදාළ ඔප්පු නොතාරිස්වරයා විසින් සකස් කිරීමේදී අඩුපාඩු සිදු වී ඇති අතර නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

3.3 නිශ්කාර්ය වියදම්

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සති පොලක් ඉදි කිරීම සඳහා 2011 වර්ෂයේදී දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් රු.මිලියන 05 ක ණය මුදලක් ලබාගෙන රු.7,807,501 ක් වැයකර ගොඩනැගිලි 03 ක් ඉදි කර තිබුණද නව වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීම සඳහා එම ගොඩනැගිල්ල කඩා ඉවත් කර තිබුණි.කඩා ඉවත් කරන ලද ද්‍රව්‍ය උපයෝගීකර ගනිමින් සභාවේ අවශ්‍යතාවයක්ව පවතින වාහන නවතා තැබීමට අංගනයක් සකස් කිරීම සභාවේ අරමුණ වී තිබුණද 2019 දෙසැම්බර් 31 දින වන විටත් මෙම ද්‍රව්‍ය තොගය ඵලදායි කටයුත්තකට නොයොදවා දිවි නැගුම පොලෙහි පැත්තක ගොඩගසා තිබුණි. සමාලෝචිත වර්ෂයේ මෙම ණය මුදලෙහි තවදුරටත් ගෙවිය යුතු මුදල රු..1,788,828 ක් වූයෙන් මේ සඳහා වැය කළ මුදල නිශ්කාර්ය වියදමක් වී තිබුණි. | ප්‍රාග්ධන වියදම් නිසි සැලසුමක් අනුව සිදු කිරීම තළ යුතුවේ. | මෙම ව්‍යාපෘතිය නාගරික සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක වන්නක් අතර මේ සඳහා බස්නාහිර පළාත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය හිමි වී ඇත.ගලවා ඉවත්කර කොටස් භාවිතා කර වාහන අංගනයෙන් කොටසක් ඉදිකර ඉතිරි කොටස වැඩ නිමකිරීමට නොහැකි වී ඇති බව දන්වමි. |

3.4 වත්කම් කළමනාකරණය

--------------------------

3.4.1 වත්කම් සමීක්ෂණය

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ ස්ථාවර වත්කම් ලේඛනයේ සඳහන් ප්‍රමාණය අක්කර 4 ක්වූ භෞතිකව සොයා ගත නොහැකි සහා දේපලක් සහ ප්‍රමාණය නොදත් දේපලක් හා බුළුගහකුඹුර බොරගොඩවත්ත අනවසර නිවාස 03 ක් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. | භෞතිකව සොයා ගත නොහැකි සහා දේපල සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කිරීම හා අනවසර නිවාස සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීම කළ යුතුවේ. | 2020 දී සමීක්ෂණය මඟින් නිවැරදි කිරීමට උපදෙස් දෙන ලද අතර අනවසර නිවාස 03 සහිත දේපළ සන්තකය ආපසු පවරා ගැනීමට අදාල නීතිමය කටයුතු සඳහා භාර දී ඇති බව දන්වමි. |